# රාහුලයේ නියමු විදුහල්පතිවරුන්



# ජී. විලියම් ද සිල්වා මහතා

## 1923-1932

මාතර රාහුල විද්‍යාලයේ සිසුවකු ලෙස අධ්‍යාපනය ලබන්නට අවස්ථාවක් ලැබීම කලාතුරකින් ලද හැකි වාසනාවක් ලෙස බොහෝවිට සළකනු ලබයි. එහි ආචාර්ය මණ්ඩලයේ සේවය කරන්නට ඉඩක් ලැබීමද භාග්‍යයක් ලෙස ගුරු මහත්ම මහත්මීහු අදත් සළකති. රාහුලයේ විදුහල්පති පදවිය ලැබීම අතිශය සම්භාවනීය සිද්ධියක් බව එහි විදුහල්පතිවරුන්ම පවසා ඇත. එසේ නම් රාහුල විද්‍යාලයේ මුල්ම විදුහල්පතිවරයා වීමට ලැබීම එක් කෙනෙකුට පමණක් ලැබෙන වරප්‍රසාදයක් නිසාම නොව, එමගින් මේ රටේ සමාජ-ආර්ථික-දේශපාලන ව්‍යුහයට අප්‍රමාණ ලෙස දායක වූ දහස් ගණන් පුරවැසියන් බිහි කිරීමට පුරෝගාමී මුල් පියවර තැබීමට හැකිවීමේ දුර්ලභ වාසනාව නිසාම වැදගත් සිද්ධියක් වනු නියතය. රාහුල විද්‍යාලයේ මුල්ම විදුහල්පති ජී. විලියම් ද සිල්වා මහතාට උදාවූයේ එම අනුපමේය වරමයි.


*"මම සැබෑ බෞද්ධයෙකු වෙමි"* යැයි අකුරු කියවා, ලියවා සිසුන්ගේ හදවතෙහි තැන්පත් කළ ඒ මාහැඟි පාඨය තුළ ගැබ්වූ ජීවමය සංකල්ප සමුදාය තුළ රාහුල විද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමට පැමිණෙන සිසු දරුවන්ගේ සිතුම් පැතුම් හා චර්යා රටාවන්ද සකස් කිරීමට පාදක වන ආරම්භයක් විද්‍යාලය තුළ ගොඩනැංවීම විලියම් ද සිල්වා විදුහල්පතිතුමාගේ ප්‍රාරම්භක ප්‍රයත්නය විය. එතුමාගෙන් ආරම්භ වී ඉක්බිතිව ගතවූ යුගයෙන් යුගය රාහුල විද්‍යාලයෙන් රටට,දැයට, සමයට වැඩදායක පුරවැසියන් නොකඩවා බිහිවීමෙන් එම ප්‍රයත්නය කෙතරම් සාර්ථක වී දැයි නිගමනය කළ හැකිය.

නව විදුහලක් ආරම්භයේදී පරිපාලනමය හා කළමනාකරණ අවශ්‍යතාවනට මුල් තැන ලැබුනද, රාහුල විද්‍යාලය සම්බන්ධයෙන් එහි ගැටළුවක් නොවූයේ සි. ඒ. ඕදිරිස් ද සිල්වා මහතා ඇතුළු මුළු පවුලම රාහුලයට ශක්තියක් වූ හෙයිනි. එහෙත් විදුහල්පතිතුමාගේද, පාලක මණ්ඩලයේද අභියෝගය වූයේ විද්‍යාලය රජයේ ලියාපදිංචි කර ගැනීමයි. *"මාතර දරුවනට ඉංග්‍රීසි අධ්‍යාපනය සඳහා වෙනත් විදුහල් තිබියදී රාහුලයක් කුමටදැ"* යි අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරීහු එක් අතකින් විමසූහ. අනෙක අතට රජයේ ලියාපදිංචි නොකළ විදුහලකට දෙමව්පියන් සිය දරුවන් යවතැයිද ඔවුහු දෙමව්පියන්ට එදිරිව නීතිය හරස් කළහ. මෙම දෙවැදෑරුම් අභියෝගයන් හමුවේ නොසැලී රාහුලය ඉදිරියට ගෙන යන්නට විලියම් ද සිල්වා විදුහල්පතිතුමා තීරණය කෙළේය.

මෙහිදී රාහුලයේ සිසු දරුවන්ගේ විනය හා හික්මීමත්, ඔවුන්ගේ දෙමාපියන්ගේ උදෙ‍්‍යාගය හා උනන්දුවත් විදුහල්පතිතුමාට අප්‍රමාණ ශක්තියක් වූයෙන් එතුමා පාලක මණ්ඩලය හා සමග එකතුව රාහුල විද්‍යාලය ආධාර ලබන විද්‍යාලයක් ලෙස රජයේ ලියාපදිංචි කරවා ගැනීමට දැරූයේ අප්‍රතිහත ධෛර්යයකි.

අවසානයේදී විද්‍යාලය ආරම්භ කළ පියර්ස් මහතාගේද සහායයෙන් රාහුලය ලියාපදිංචි කරවා, ගුරු-සිසු සංඛ්‍යාවද ක්‍රම ක්‍රමයෙන් වර්ධනය කොට, අධ්‍යාපන තත්ත්වයද ඉහළ මට්ටමකට නංවා, රාහුලයට ස්ථාවර පදනමක් ලබා දෙන්නට විලියම් ද සිල්වා මහතා සමත්විය. පසු කලෙක එතුමා රාහුල ආදි සිසුන්ගේ උත්සව සභාවකදී මෙසේ සඳහන් කළේ එහෙයිනි.

***"The happiest time of my life was the days I spent with my pupils at Rahula, and I often recall their affection and cooperation during the whole of my career at Rahula".***



# ආචාර්ය සී. අම්ර්තලිංගම් මහතා
## 1932-1936


සියලු ජාතින්ගේ හා ආගමිකයන්ගේ එකමුතු බව හා සහෝදරත්වය කැපී පෙණුනු ආසියාතික රටවලින් මුලින්ම නම් කැරුණු රට වශයෙන් ලංකාව හැඳින්විය හැකිය. ඒ ලංකාව නිදහස ලබන්නට කලකට ඉහතය. මේ නිසාම ලංකාවේ සමාජ-ආර්ථික හා දේශපාලන පරිසරයේ කටයුතු වලදීද මේ අන්‍යෝන්‍ය විශ්වාසය පැහැදිලිව දැකගත හැකිවිය. අධ්‍යාපන ක්ෂේත්‍රයන්හිදී එය එපරිද්දෙන්ම සිදුවිය. සිංහල බෞද්ධ අධ්‍යාපනය වැඩිදියුණු කිරීම පිණිස ආරම්භ කළ රාහුල විද්‍යාලයට වයස අවුරුදු 10 ක් ගත වන්නටත් පෙර ද්‍රවිඩ වාර්ගික හින්දු භක්තික මහත්මයකු එහි විදුහල්පති පදවිය සඳහා තෝරා ගන්නට විද්‍යාලයේ සිංහල බෞද්ධ කළමනාකරුවන් හා පාලක පිරිස තිරණය කළේ ජාතික ආගමික සමගිය කෙරෙහි තැබූ අචල විශ්වාසය නිසාම විය යුතුය.

එහෙත් එසේ තෝරා ගනු ලැබූ ආචාර්ය සී. අම්ර්තලිංගම් මහතා එසේ මෙසේ පුද්ගලයෙකු නොවේ. ඔහු වනාහි එවකට ලංකාවේ සුප්‍රසිද්ධ ද්‍රවිඩ ජාතික *"ලිංගම්"* සහෝදර පිරිස වන පංචලිංගම්, නාගලිංගම්, සුන්දරලිංගම්, සහ ත්‍යාගලිංගම් කණ්ඩායමේ සාමාජිකයෙකි. ඔවුන් හැම කෙනෙක්ම ස්වකිය වෘත්තිය ක්ෂේත්‍රයන්හි අපූර්ව දස්කම් පෑ අයවූහ. අම්ර්තලිංගම් මහතාද විද්‍යා උපාධියක් ලබා ආචාර්ය උපාධියද දිනා සිටියේය.

ආචාර්ය අම්ර්තලිංගම් මැතිතුමන් 1932 දෙසැම්බරයේ සිය නිල කටයුතු අරඹන විට සිසු පිරිස 150 ක් පමණ විය. ආචාර්ය මණ්ඩලයේ මහත්වරුන් 10 දෙනෙක්ද, මහත්මීන් දෙදෙනෙක්ද වූහ. තමනට පෙර සිටි විදුහල්පතිතුමන් විසින් ආරම්භ කරන ලද සත් කාර්යයන් දිගටම ඉටු කරන්නට වග බලා ගත් අම්ර්තලිංගම් මහතා සිසුන් අතර ජනප්‍රිය විය. අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි මෙන්ම ක්‍රීඩා අංශ කෙරෙහිද දැඩි අවධානය යොමු කළ එතුමා ඇතැම් විට සිසුන් සමග එක්ව ක්‍රීඩා කළේය. ඔවුන් සමග විහිළු තහළුද කළේය. එහෙත් විනය පවත්වා ගැනීමට හා සිසුන් අධ්‍යාපනයට යථා පරිදි යොමු කරවීමට ඔහු අමතක කළේ නැත.

එතුමාගේ කාලයේදී කේම්බ්‍රිජ් සීනියර් විභාගය හඳුන්වා දෙනු ලැබූ හෙයින් පාසල් හැරයාමේ විභාගයට වඩා එම විභාගයට මුල්තැන ලැබිණි. සෑම විභාගයක් සඳහාම සිසුන් උනන්දු කරමින් ඔවුන් සමග පමණක් නොව ඔවුන්ගේ දෙමව්පියන් සමගද පෞද්ගලිකව කතා බස් කරමින් ගැටළු වලට විසඳුම් සොයන්නට ආචාර්ය අම්ර්තලිංගම් මහතා සැළකිලිමත් වූයේය. විදුහල් කාල සීමාවෙන් බාහිරව පවා නේවාසිකාගාර සිසුන්ගේ ආහාර පාන හා සුව පහසුව, ආචාර්ය මණ්ඩලයේ ඕනෑ එපාකම් සහ විදුහලේ අවශ්‍යතාද විමසා බලන්නට එතුමා අමතක නොකළ අතර සිසුන්ගේ උද්‍යෝගය හා අන්‍යෝන්‍ය සම්බන්ධතා ගොඩ නැංවීම පිණිස විවිධ තරගයන් සංවිධානය කොට ත්‍යාග පවා පරිත්‍යාග කළේය.

දක්ෂ වැඩිහිටි සිසුන් ස්වේච්ඡාවෙන් ඉගැන්වීම් කටයුතු වල යෙදවීමට පවා එතුමාට හැකිවිය. බාහිර බලවේග විවිධාකාර ලෙස ක්‍රියාත්මක වන විට අම්ර්තලිංගම් මහතා වැනි විද්වතකුට වුවද ගැටළු පැන නැගීම ස්වාභාවිකය. අවසානයේ හිටි හැටියේම එතුමාට අනපේක්ෂිත ලෙස රාහුලයෙන් සමුගන්නට සිදුවූයේ ඒ නිසා විය හැකි යැයි එවකට රාහුලයේ සිටි ශිෂ්‍යයෝ පවසති.



# ජේ. ආර්. භාට් මහතා

## 1936-1937

දෙස-බස-රැස වෙනුවෙන් නැණවතුන්, උගතුන්, විද්‍යාඥයින්, පඬිවරුන් හා ජාතික නායකයින් බිහි කළා සේම රාහුල විද්‍යාලය සටන්කාමීන් හා විප්ලවවාදීන්ද රටට දායාද කොට දී ඇත. සිසුන් අතර ජනාදරයට පත්වූ විදුහල්පති වරයකුට හදිසියේම වාගේ එම ධුරයෙන් ඉවත්වන්නට සිදුවූයෙන් කැළඹීමට පත්වූ සිසු පිරිසකගේ අවිචාරවත් කටයුතු නිසා විදුහල් පාලනය හා විනය රැක ගැනීම මේ යුගයේදී අසීරු විය. එවන් සිසුන් පිරිසක් විසින් විද්‍යාලයේ ගොඩනැගිලි හා ලී බඩු වලට පමණක් නොව කාර්යාලයේ ලිපි ලේඛණ වලටද මහත් හානි සිදුකොට තිබූ සමයක රාහුල විද්‍යාලයේ නියමුවා වන්නට තරම් භාට් මහතා එඩිතර විය. එතුමා වැඩ බලන විදුහල්පති වශයෙන් කටයුතු කෙළේ 1936 සැප්තැම්බර් 01 වැනිදා සිට 1937 පෙබරවාරි 01 වැනිදා වනතුරු පමණි. ඒ නව විදුහල්පති වශයෙන් තෝරා ගනු ලැබ සිටි ඩී. ජේ. කුමාරගේ මහතා පැමිණෙන තුරුය.

භාට් මහතා ඉන්දිය බ්‍රාහ්මණ වංශිකයෙකි. විද්‍යා උපාධි ධරයකු වූ මෙතුමා විද්‍යා පොත පත රැසක්ම ලියූ විද්වතෙකු විය. ඉතා කඩවසම් පෙණුමකින් යුතු වූ භාට් මහතා සිය බිරිඳ හෝ දරුවන් සමග මාතරට පැමිණියේ නැත. ඒ වෙනුවට එතුමා නවාතැන් ගත්තේද රාහුල නේවාසිකාගාරයේ කාමරයකය. භාට් මහතා මස්මාංශ අනුභවයෙන් වැළකුණු අයකු වූ අතර ස්වකීය ආහාර වේල තමන් අතින්ම පිළියෙළ කර ගන්නට එතුමා පුරුදුව සිටියේය.

භාට් මහතා වැඩ බලන විදුහල්පති වශයෙන් ක්ෂණිකව ආරම්භ කළ විනය හා හික්මීම පෙරදැරි කරගත් විද්‍යාලයීය පරිපාලනය නිසා ජ්‍යෙෂ්ඨ සිසුන්ගේ ආවේග හා ගැටුම් ඉක්මණින්ම සමාප්ත වී සාමය නැවතත් පැතිරෙන්නට විය. මෙය පමණක්ම භාට් මහතාගේ පරිපාලන කෞශල්‍යයට අගනා සාධකයකි. විද්‍යාලයේ සාමය ඇති කළ පසු සිසුන් අතර ක්‍රීඩා තරග, සාහිත්‍ය කටයුතු, කලා ශිල්ප ආදිය ප්‍රගුණ කළා පමණක් නොව පසළොස්වක පොහෝ දින ශිල ව්‍යාපාර පවා දියත් කෙළේය. එවැනි අවස්ථාවල භාට් මහතාද සිල් සමාදන්ව සිටිනු දක්නට හැකිවිය.

භාට් මහතා වැඩ බලන විදුහල්පති පදවියට පත් කරනු ලැබීමෙන් පසු එතුමා සී. ඒ. ආරියතිලක මහතාගේද සහායයෙන් සුවිශේෂ මහා සභා රැස්වීමක් රාහුල විද්‍යාලයේ දී පැවැත්විය. මේ රැස්වීමට මාතර ප්‍රදේශවාසීන් රැසක්ම සහභාගි වූ අතර දේශන පැවැත්වූයේ පූජ්‍යපාද නාරද හිමි, රාජා හේවාවිතාරණ, හෙන්රි අමරසූරිය, ඩේවිඩ් වණිගසේකර, පණ්ඩිත ගුණවර්ධන ආදී සිංහල බෞද්ධ ප්‍රභූන්ය. ඒ හැම කෙනෙකුම ඉල්ලා සිටියේ රාහුලය බේරා ගැනීම සඳහා භාට් මහතාට සහාය වන ලෙසය. මාතර නගරවාසීහු එකහෙලා එම ඉල්ලීම ඉටු කළහ. මෙසේ රාහුල විද්‍යාලයේ පරිසරය යථා තත්ත්වයට පත් කොට 1937 ජනවාරි මස එළැඹෙන විට විද්‍යාලය ඉක්බිතිව පැමිණෙන කුමාරගේ විදුහල්පතිතුමාගේ පාලනයට බාර දෙන්නට භාට් මහතා සියල්ල සූදානම් කොට තිබිණි.

රාහුල විද්‍යාලයේ විදුහල්පතිවරුන් අතුරෙන් ඉතාම කෙටි කාලයක් සේවය කළ විදුහල්පතිතුමා භාට් මහතා වුවද *"රාහුල විද්‍යාලය පිළිබඳව ලියැවෙන ඉතිහාසයේ භාට් මහතාගේ කෙටි කාලීන සේවා කාලය තුළ සිදුවූ වෙනස ගැන සඳහන් නොවේ නම් එය අසම්පූර්ණ රාහුල ඉතිහාසයක් වනු ඇත"* යි සිය ජීවිත කාලයෙන් හරි අඩක් රාහුලය හා බැඳී කටයුතු කළ, කලක් විදුහල්පති ධුරය දැරූ බී. පී. ආරියවංශ මහතා සඳහන් කරන්නේ ඉහත සඳහන් කරුණු නිසා විය හැකිය.



# ඩී. ජේ. කුමාරගේ මහතා
## 1937-1956

ශ්‍රී ලංකාවේ පහළ වූ ධර්මධර, විනයධර, සුපේශල ශික්‍ෂා කාමී අග්‍රගණ්‍ය ස්වාමීපාදයාණන් වහන්සේ නමක වන ගරු පණ්ඩිත වැලිවිටියේ සෝරත නායක හිමියෝ ශාස්ත්‍රාචාර්ය ඩී. ජේ. කුමාරගේ මහතා ගැන මෙසේ සඳහන් කළ සේක.

> *"මම කලක් කුමාරගේ මහතා ඇසුරු කෙළෙමි. මම ඒ මහතාගෙන් ඉංග්‍රීසි භාෂා ශාස්ත්‍රයන් උගත්තෙමි. ඒ මහතා මගෙන් පාලි, සිංහල භාෂා සාහිත්‍ය හා බුද්ධ ධර්මයද උගත්තේය. ගුරුවරයෙකු වශයෙන් ඒ මහතා අතිශය ශ්‍රේෂ්ඨය. අන්‍යයන් විසින් මාසයකින්වත් ඉගැන්විය නොහැකි දෙය ඒ මහතා දවසකින් දෙකකින් උගන්වයි. ඉතා ලුහුඬු මංවලින් ශිෂ්‍යයා වුවමනා තැනට යැවීමට ඒ මහතා දක්ෂය. කුමාරගේ මහතාගේ අදහස් උතුම්ය. කාරුණිකය. ධනාපේක්‍ෂාවෙන් තොරය".*

පොත් ගණනක් ලියා කිව නොහැකිදේ නායක හිමියෝ එසේ සඳහන් කළහ. දහසක් මුවින් පැවසුවද ගැඹුරක් නොහැඟෙන දේ උන් වහන්සේ සරල හා සුගම බසින් එසේ පැහැදිලි කළහ. තමනට ගුරු වූ, තමනට ගෝල වූ කෙනෙකු ගැන සාධු හදවතක එවන් භක්ත්‍යාදරයකින් පිරුණු හැඟීම් ජනිත වන්නේ කුමාරගේ මහතා කෙරෙහි පමණකැයි ඇදහිම නිවැරදිය.

සියලු පෘථුග්ජනයින් තුළ මෙන්ම එතුමා තුළද අඩු ලුහුඬුකම් නොතිබුනා නොවේ. ඒවා වුවද එතුමා ගැන දන්නා හැමදෙනාම දුටුවේ කුමාරගේ මහතාගේ ශක්තීන් ලෙසය. එහෙයින් ඔවුහු එය තමන්ගේද ශක්තිය කර ගත්හ. *"අත්තානං දමයන්ති පණ්ඩිතා"* යන රාහුල ආදර්ශ පාඨය වෙනුවෙන් දෙස් විදෙස් තුළින් කෙනෙකුට හමුවෙන අති උත්තරීය සාධකය නම් දොන් ජොහැන්නස් කුමාරගේ මහතා යැයි සැළකිය හැකිය.

එතුමා රාහුල විද්‍යාලයේ විදුහල්පති පදවිය දැරූ 1937 සිට 1956 දක්වා වූ කාලය විද්‍යාලයේ ස්වර්ණමය යුගය ලෙස ඊට පෙරත්, ඊට පසුත් රාහුලයේ උගැන්වූ ගුරු පිරිසත්, උගත් සිසු පිරිසත් පවසනුයේ එතුමාගේ ඉහත කී සාධක නිසා විය යුතුය. එතුමාගේ යුගය තුළ සෑම සඳුදාවකම උදෑසන අටට පැවැත්වෙන සිසු මහා සභාව රාහුලයේ අපූර්වතම සිද්ධිය ලෙස රාහුල සිසුහු දුටහ. පන්ති කාමරයේදී කලා හෝ විද්‍යා විෂයයන් හෝ ගණිතය උගත්තාසේම, ජිවිතයේ සෙසු සෑම සියලු ගුණාංගයක්ම ඔවුන් උගත්තේ සිසු මහා සභාවේදිය. බෞද්ධ හිමි නමක් ආගමික ධර්මතාවන් සිසු ජිවිතයට එකතු කරන අතර විදුහල්පති කුමාරගේ මහතා සහ ජස්ටින් විජයවර්ධන මහතා සිසු දරුවන්ගේ ජාතික හැඟීම් ඔප මට්ටම් කරමින්, පෞරුෂත්වය වර්ධනය කරමින්, ගුණ-ණැන පහන් කරමින් මිනිස්කම ගැන සිසු දරුවනට උගැන්වූයේ මෙම සභාවේදිය.

සරම් වලව්ව ඉදිරිපිට හදවතක ස්වරූපය ගත් බිම් කොටසේ තණ නිල්ලේ මුදු පහස ලැබ ගනිමින් රාහුල සිසුන් සිය හදවත් උතුම් මානව සංකල්පයන්ගෙන් හා ගුණාංගයන්ගෙන් පුරවා ගත්තේ විදුහල්පති කුමාරගේ මහතා සිසු මහා සභාවේදි කළ කී දෑ අනුවය. එතුමා එසේ රටට, දැයට, සමයට නිර්මාණය කර දුන් රාහුල පුතුන් දහස් ගණනක් දැන් රාහුල වජ්‍ර ජයන්ති සමයේදී දෙස-රැස-බස හොබවති. එහෙත් එම සතුට ලබන්නට ශාස්ත්‍රාචාර්ය ඩී. ජේ. කුමාරගේ ගුරු දේවයාණන් සිය ගෝල පිරිස අතර නැත. එතුමා 1978 ඔක්තෝබර් 12 දින පරලෝ සැපත් විය. එහෙත් *"මේ කුමාරගේ යුගයේ රාහුල දරුවෝ"* යයි නැගෙන හඬ දස දිසාවෙන්ම ඇසේ. එතුමා සිටියදිට වඩා දැන් ඒ හඬ නින්නාද දෙයි.



# බී. පී. ආරියවංශ මහතා

## 1956-1973


මාතර රාහුල විද්‍යාලය ආරම්භ වුයේ 1923 දිය. බී, පී, ආරියවංශ මහතා උපන්නේද 1923 දිය. රාහුල විද්‍යාලයට දැන් වයස අවුරුදු 75 ක් මෙන්ම ආරියවංශ මහතාටද: වයස අවුරුදු 75 කි. රාහුල විද්‍යාලයේ මෙන්ම එතුමාගේ ද වජ්‍ර ජයන්තිය මෙයයි. රාහුල විදුහල් මාතාවගේත් ආරියවංශ ගුරු පියාණන්ගේත් සබඳතාවන් එපමණක්ම නොවේ. රාහුල මාතාවගේ වයසින් හරි අඩක කාලයක් පමණ ආරියවංශ මහතා ශිෂ්‍යයකු, උපාධිධාරී ගුරුවරයකු, උප විදුහල්පතිවරයකු හා විදුහල්පතිවරයකු වශයෙන් රාහුලය හා අත්වැල් බැඳගෙන ජීවිතය ගත කෙළේය.

බිළිඳු වියේදිම රාහුල විදුහලට බැඳි, පන්තියෙන් පන්තිය නොව පන්ති දෙකෙන් දෙක ශිෂ්‍යත්ව ලබා ඉහළට ගොස්, විද්‍යාලයීය ක්‍රිඩා හා සෙසු ශිෂ්‍ය කණ්ඩායම් රැසක නායකත්වය දරා විද්‍යාලයෙන් කෙළින්ම සරසවියට ඇතුළු වූ මුල්ම ශිෂ්‍යයා වෙමින්, ඉක්බිතිව උපාධිය දිනු පසු පෙරලා විද්‍යාලයටම පැමිණ ආචාර්ය, උප විදුහල්පති, විදුහල්පති තනතුරු හොබවා අධ්‍යාපන අම්බරයේ දිදුළන තාරකාවක් බවට පත්වූ බී. පී. ආරියවංශයින් එවැනි ජයග්‍රහණ ලත් ඉතා කලාතුරකින් දැකිය හැකි කෙනෙකු ලෙස හැඳින්විය හැකිය.

සිව් මං සන්ධියක අතරමං වන්නට ගිය රාහුල විද්‍යාලයට මං පෙත හෙලි පෙහෙළි කොට මෙරට අධ්‍යාපන ක්‍ෂෙත්‍රයේ ස්මාරකස්ථම්භයක් බවට විද්‍යාලය පත් කළ කුමාරගේ විදුහල්පතිතුමන් රාහුලයේ අනාගතය ආරියවංශ උප විදුහල්පතිතුමන්ට භාර දිමේ ඓතිහාසික කාර්යය 1956 දෙසැම්බරයේ සිදුවිය. එහි උත්කෘෂ්ඨතම අවස්ථාව වුයේ සරම් වලව්ව ඉදිරිපිට තණ පළසේ සිට රාහල සිසුන් දහසක් දෙනා විද්‍යාලයෙන් සමුගන්නා කුමාරගේ මහතා ගැන සංවේගයක්ද, නව විදුහල්පති ආරියවංශ මහතා ගැන සන්තෝෂයක්ද මුසුවූ හැඟිම්වලට අවනතව බලා සිටියදී, ආරියවංශ ගුරු පියාණන් කුමාරගේ ගුරු දේවයන්ගේ දෙපා නැමද ඉක්බිතිව *"මගේ ආදරණීය රාහුල සිසු දරුවෙනි"* යනුවෙන් සිසුන් ඇමතූ ස්වර්ණමය මොහොතයි. සැබැවින්ම එය ආරියවංශ මහතාට වඩා කුමාරගේ මහතාගේ ස්වර්ණමය මොහොත වූයේය.

1956 දි ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික-දේශපාලන පෙරැළි රැසක් සිදු වුවද රාහුලයේ පෞරුෂත්වය හා කිර්ති කදම්බය පෙරැළි යන්නට එතුමා ඉඩ නොදුන්නේය. විද්‍යා අංශයට සත්ත්ව විද්‍යාව ඇතුළත් කොට විද්‍යා අධ්‍යාපනය ප්‍රබල කළේය. කලා අංශයේ අඩුපාඩු විමසා බලා ගුරු-සිසු සබඳතාව තුලින් අධ්‍යාපන කටයුතු ශක්තිමත් කළේය. මේ නිසා පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත්වන සිසුන් ගාල්ල හෝ කොළඹ විදුහල්වලට ඇදියාමද නතර විය. ක්‍රිඩාංගනය ප්‍රතිසංස්කරණය කොට සියලු ක්‍රිඩාවන්හි අවශ්‍යතා හැකි පමණින් සපුරාලන්නට පියවර ගත්තේය. වාර්ෂිකව විදුහලක පැවැත්විය යුතු අන්තර් නිවාසයීය ක්‍රිඩා තරග, ත්‍යාග ප්‍රදානෝත්සව, සභරා පළ කිරිම ආදි බාහිර ක්‍රියාකරකම් ද ධෛර්යමත් කෙළේය. එයින් ලද මහඟු ප්‍රතිඵලයක් නම් 1965 දි සමස්ත ලංකා සාමාන්‍ය දැනිම තරඟයෙන් රාහුලය ප්‍රථම ස්ථානය හිමිකර ගැනිමයි.

උප විදුහල්පති ආරියවංශ මහතාත්, විදුහල්පති ආරියවංශ මහතාත් අතර කැපී පෙණුනු වෙනසක් රාහුල සිසුන්ට දැක ගත හැකිවිය. සිසුන්ගේ දඟකාරකම් දුටුවිට හා විනය-හික්මීම ඔවුන් අතින් කඩවූ විට උප විදුහල්පති ආරියවංශ මහතා සිය විදුහල්පති කුමාරගේ මහතා වෙතට එම සිද්ධින් පැමිණිලි කිරිම වළක්වා තමාම ඔවුනට අවවාද කොට ඔවුන් නිදහස් කෙළේය. එහෙත් විදුහල්පති ආරියවංශ මහතා එවැනි සිද්ධින්ට මුල්වූ සිසුන් තමා විසින්ම සොයාගෙන ගොස් ඔවුන්ට දැඩි දඬුවම් පැමිණවූයේය.



# බී. සූරිආරච්චි මහතා
## 1973-1979

සම්ප්‍රදාය සුදුසු පරිදි සුරකින්නටත්, අවශ්‍ය වූ විටෙක එය වෙනස් කරන්නටත් නොපැකිලෙන පෞරුෂත්වයක් ඇති අධ්‍යාපනඥයකු ලෙස බුද්ධදාස සූරිආරච්චි මහතා රාහුල විද්‍යාලයේ විදුහල්පති වශයෙන් කටයුතු කළ කාලයේදී කැපී පෙනුණි. 1973 මාර්තු මාසයේ 01 වැනිදා සිට 1979 මාර්තු මාසය දක්වා එතුමා රාහුල විදුහල්පති ධූරය දැරීය.

සූරිආරච්චි මහතා රාහුල විද්‍යාලයට බැඳෙන්නට පෙර විදුහල්පතිවරුන්ගේ හා සුවිශේෂ අමුත්තන්ගේ සටහන් තබන *"ලොග්"* පොත භාවිතා කිරීමේ දී අනුගමනය කළ පැරණි සම්ප්‍රදාය විදුහල්පති පදවියට පත්වූ පළමු දිනයේම බිඳ දැමීය. නිවාඩු ලබා සේවය සඳහා නොපැමිණෙන ගුරුවරුන්, ප්‍රමාද වී විද්‍යාලයට පැමිණෙන ගුරුවරුන්, වරුවකින් නිවාඩු ලබා යන ගුරුවරුන් ආදීන්ගේ නම් ලැයිස්තු දීර්ඝ වශයෙන් එදිනෙදා *"ලොග්"* සටහන් වලට අන්තර්ගත කිරීමේ සම්ප්‍රදාය වෙනුවට විද්‍යාලයේ සිදුවන සුවිශේෂ සිද්ධීන් පමණක් සටහන් ගත කිරීම රාහුල විද්‍යාලයේ ආරම්භ කෙළේ මෙතුමාය.

රාහුල ශිෂ්‍ය නායකයින් සිය නායකත්ත්ව වගකීම් නිහඬව භාර ගැනීමේ සම්ප්‍රදාය වෙනුවට ප්‍රධාන ශාලාවේ වේදිකාව මත හෝ එළිමහන් වේදිකාව මත විද්‍යාලයේ ගුරු සිසු හැමදෙනා අබියසදී පාඨයක් කියවා දිවුරුම් දීමේ සම්ප්‍රදාය ඇති කෙළේද සූරිආරච්චි විදුහල්පතිතුමාය.


ගාල්ලේ රිච්මන්ඩ් විද්‍යාලයේ අධ්‍යාපනය ලබා එහිම ආචාර්ය මණ්ඩලයේ සේවය කළ මෙතුමා, වෘත්තියමය උසස්වීම් කිහිපයකට පසු රාහුල විදුහල්පති ධූරය දැරූ යුගයේදී ශ්‍රී ලංකාවේ අග්‍රගණ්‍ය විදුහල්පතිවරුන් ගමන් ගත් ස්වර්ණමය මාවත මෙතුමාට විවෘත වී යැයි කීම නිවැරදිය.

බුද්ධදාස සූරිආරච්චි මහතාගේ යුගයේදී රාහුල අධ්‍යාපනය ලැබූ සිසුන් හා කුමාරගේ යුගයේ සිසුන් අතර වෙනසක් ඇත්නම් ඒ වයසේ වෙනස පමණකැයි කිව හැකියි.

සූරිආරච්චි මහතාගේ විදුහල්පති යුගයේදී විද්‍යාලයීය ඉතිහාසයේ උසස්ම අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵල රාහුල විද්‍යාලය ලබා ගත් බව වාර්තා වෙයි. එසේ විද්‍යාලයේ ඉහළ පන්තිවල අධ්‍යාපන මට්ටම උසස් තලයක පවත්වා ගැනීම නිසා ශිෂ්‍යත්ව දිනූ මාතර හා හම්බන්තොට සිසුන් අගනුවර විදුහල්වලට ඇදී යාම වළක්වා ඔවුන් වැඩි දෙනෙකු රාහුලයට බඳවා ගැනීමට හා රාහුලයේම රඳවා ගැනීමට එතුමාට හැකිවූයේය.

ක්‍රීඩා අංශයෙන් රාහුලය පියවර කිහිපයක්ම පෙරට එන්නට හේතුවූයේ විදුහල්පති සූරිආරච්චි මහතාගේ උනන්දුවයි. මලල ක්‍රීඩා පුහුණුවට දෙනු ලැබූ ධෛර්යයේ මාහැඟි ප්‍රතිඵලයක් වූයේ රාහුල විද්‍යාලයේ කණ්ඩායම විසින් මීටර් 100 කඩින් කඩ සහාය දිවීමේ ඉසව්වේ ජාතික පාසල් වාර්තාවද බිඳ දැමීමයි. සමස්ත ලංකා පාසල් බැඩ්මින්ටන් සංගමයේ සභාපති වශයෙන් කටයුතු කළ මෙතුමා රාහුල විද්‍යාලයේ ශිෂ්‍යයින් බැඩ්මින්ටන් ශූරයින් කිරීමේ තැත අත්හලේම නැත. අවසානයේ ඔවුහු එම ශූරතාවය ද දිනා ගන්නට තරම් සමතුන් වූහ.

සූරිආරච්චි මහතාගේ දස්කම්වලට රජයෙන්ද සම්මාන පිදුනු අවස්ථා අපමණය. එතුමා රාහුලයෙන් රිච්මන්ඩ් විද්‍යාලයටත්, එතැනින් කොළඹ රාජකීය විද්‍යාලයටත් විදුහල්පති ධූරය සඳහා රටේ ජනාධිපතිතුමා විසින්ම තෝරා ගනු ලැබීම තරම් වාසනාවක් කිසිවකුට හිමි කර ගැනීම එතරම් පහසු නැත.



# ඒ. එච්. ගොඩවිතාරණ මහතා
## 1979 - 1983

රාහුල විද්‍යාලයේම ආදි ශිෂ්‍යයින් අතුරෙන් රාහුලයේ විද්‍යාලයාධිපති ධුරය හොබවන්නට තේරී පත්වුනු දෙවැනි ආදි ශිෂ්‍යයා ඒ. එච්. ගොඩවිතාරණ මහතාය. මුලින්ම මාතර සුජාතා විද්‍යාලයෙහි අධ්‍යාපනය අරඹා ඉන්පසු ශිෂ්‍යයකු වශයෙන් 1948 දී රාහුලයට බැඳී දිගටම එහි අධ්‍යාපනය හදාරා ගොඩවිතාරණයින් 1958 වර්ෂයේ දී විශ්ව විද්‍යාලයට ඇතුළත් විය. රාහුල විද්‍යාලය විද්‍යා විෂයයන්හි සමතුන් සඳහා වාර්ෂිකව පිරිනමන නිහාල් සමරසේකර ශිෂ්‍යත්වය 1957 දී දිනාගන්නට ඔහු සමත් වු අතර එවකට රාහුල විද්‍යාලයේ විද්‍යා විෂයයන් උගැන්වූ දකුණු ඉන්දියානු දක්ෂ විද්‍යා ගුරුවරුන්ගේ සුවච ශිෂ්‍යයකු ලෙස ඔහු හැඳින්වුනේ සෙසු සිසුන්ට වඩා නිහඬතාවක් හැමවිටම ගොඩවිතාරණයින්ගෙන් පිළිබිඹු වූ නිසාය.

1979 ජනවාරි මාසයේදී රාහුල විදුහල්පති පදවියට පත්වීමෙන් පසු එදා ශිෂ්‍යයකු වශයෙන් රාහුලයට දැක්වූ ඇල්ම හා ගෞරවය යලිත් ඉස්මතු කරගත් හෙයින් ගොඩවිතාරණ මහතා වෙතින් විශිෂ්ට සේවයක් ඉටුවන ලකුණු දිස්විය. තමා ශිෂ්‍යයකු ලෙස අධ්‍යාපනය ලබද්දී සිය ගුරු දේවයාණන් දෙපොලක්වූ විදුහල්පති කුමාරගේ හා ආචාර්ය ජස්ටින් විජයවර්ධන මහත්වරුන් වෙනුවෙන් විද්‍යාලයේ මන්දිර දෙකක් නම් කර විවෘත කිරීම ඉන් මුල් තැන ගනී. රාහුලයෙන් විශ්‍රාම ගෙන සිටි ජස්ටින් විජයවර්ධන මහතා තමා නමින් විජයවර්ධන ශාලාව විවෘත කිරීමේ උත්සවයට පැමිණ සතුටු කඳුළු හෙලූ අයුරු ගොඩවිතාරණ මහතා සිහිපත් කරනුයේ තමන්ගේ දෑස්ද කඳුලින් තෙත් කර ගනිමිනි. විද්‍යාලයේ මුල් අවදියේදී රාහුලයට සම්බන්ධව සිටි ඕදිරිස් ද සිල්වා පවුලේ සෙන්පති සී. ඒ. ධර්මපාල මහතා නමින් ධර්මපාල ශාලාව නම් කොට විවෘත කළේද මේ යුගයේදීමය.

මාතර දිස්ත්‍රික්කයේ කාලයකින් සිදුවූ සුවිශේෂ බෞද්ධ පුණ්‍ය කර්මයක් වශයෙන් සැළැකෙන අනුරාධපුරයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුරයක් රාහුල විද්‍යාල භූමියේදී රෝපණය කැරැවීම සිදුවූයේ ගොඩවිතාරණ මහතාගේ යුගයේදීය මෙම ශ්‍රී මහා බෝධි අංකුරය 1980 වර්ෂයේදී රෝපණය කරන ලද්දේ එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපති ධුරයේ කටයුතු කළ ජේ. ආර්. ජයවර්ධන මැතිතුමන් විසිනි. අළුතින්ම ඉදි කැරුණු කුමාරගේ, විජයවර්ධන හා ධර්මපාල මන්දිරවලට මුල්ගල් තැබුනේද මෙදිනමය.

ගොඩවිතාරණ යුගයේදී රාහුල විද්‍යාලයේ ගුරු-ශිෂ්‍ය පරිපාලනයද, අධ්‍යාපන, ක්‍රීඩා හා සෙසු කෞශල්‍යයන්ද ඉහළ මට්ටමක පැවැතිම අධ්‍යාපන ක්ෂෙත්‍රයේ කතාබහට ලක්වූ එක් මාතෘකාවක් වූයේය. අධ්‍යාපන අමාත්‍ය නිශ්ශංක විජයරත්න මහතා සිය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක්ද කැටුව රාහුල විද්‍යාලයට විත් විද්‍යාලයේ පරිපාලන සැළැස්ම පරීක්ෂණයකට ලක් කොට ප්‍රශංසාත්මක සටහනක් තැබූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි.

1982 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුල් පෙලේ විදුහල්පතිවරුන් සඳහා ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනමන ලද ජාත්‍යන්තර ශිෂ්‍යත්වයක් ගොඩවිතාරණ මහතාට දිනා ගත හැකි විය. ඒ අනුව ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවර ජාත්‍යන්තර පුහුණු ආයතනයේ *"ද්විතීයික පාසල් කළමනාකරණය"* පාඨමාලාව සාර්ථකව හදාරන්නට එතුමාට වරම් ලැබිණි. කලකට පෙර රාහුල විද්‍යාලයෙන් වෙන්කරනු ලැබූ ප්‍රාථමික අංශය නැවත එකතුකර ගැනිමට ගොඩවිතාරණ විදුහල්පති තුමා දැරූ මාහැඟි උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් විවිධ බාධක රැසක් මධ්‍යයේ වුවද එය ඉටු කර ගැනිමට හැකි වීම එතුමාගේ පෞද්ගලික ජයග්‍රහණයක් සේ සැළකිය හැකිය.



# පී. විජයවර්ධන මහතා
## 1983-1986

රාහුල විද්‍යාලයේ එක් එක් යුගවල විදුහල්පති ධුරයට පත්වූ විදුහල්පතිවරුන් හැම දෙනාම පාහේ බොහෝ දුරට නගරයට වඩා ගමට සම්බන්ධ වූ අය වූහ. ඔවුන් ගැමියා හා ගැමි සංස්කෘතිය හොඳින් දැන සිටීම නිසා නගරයට වඩා ගමට සමීප වූ රාහුල සිසු පරපුරට සිංහල බෞද්ධ පරිසරය තුළම වර්ධනය වන්නට මග පෙන්වීම පහසු විය. 1983 දී රාහුල විදුහල්පති ධුරය භාර ගත් පී. විජයවර්ධන මහතාද මෙවන් විදුහල්පතිවරයකු වූයේය.

ගමේ පාසලින් රත්ගම දේවපතිරාජ මහා විද්‍යාලයට බැඳී එහිදී ද්විතියික අධ්‍යාපනය සාර්ථක ලෙස නිමා කොට ඉංග්‍රීසි ගුරුවරයකු ලෙස ගුරු වෘත්තිය ආරම්භ කළ එතුමා පසුව ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උපාධියක් දිනා ගත්තේය. ඒ අනුව වයස අවුරුදු 35 දීම විදුහල්පති ධුරයක් ලත් විජයවර්ධන මහතා ඉක්බිතිව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අනුයුක්තව 1983 දී රාහුල විද්‍යාලයේ විදුහල්පති පදවියට පත්විය.

එම කාලයේදී දකුණු පළාතේ පැවැති භීෂණයේ සෙවනැල්ල රාහුල විද්‍යාලයේ තරුණ සිසුන් හා ගුරුවරුන් දෙසටද වැටී තිබුනු හෙයින් නව විදුහල්පතිතුමාට මෙය තීරණාත්මක ආරම්භයක් විය. විවිධ අතවර හා තර්ජන වලට ලක්වූ පවුල් වල රාහුල දරුවන් ආරක්ෂා කර ගැනීමේ වගකීම තමන්පිට පවරා ගත් විදුහල්පතිතුමා දෙමව්පියන් වෙනුවෙන් හමුදා කඳවුරු, පොලිසිය හා වෙනත් ස්ථාන සොයා යැමද සිය රාජකාරියක් කර ගත්තේය.

එවකට පැවැති අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා යටතේ ඉදිරිපත් කරන ලද ජාතික පාසල් සංකල්පය අනුව දිවයිනේ ප්‍රථම වරට නම් කරන ලද ජාතික පාසල් 20 අතුරෙන් රාහුල විද්‍යාලයට ද එම සම්මානය හිමිවූයේ විජයවර්ධන විදුහල්පතිතුමාගේ යුගයේදීය. මුළු මහත් ලෝකයම පරිඝනක ශිල්පය දෙසට නැඹුරුවෙද්දී රාහුල විද්‍යාලයීය සිසුන්ටද එම තාක්ෂණය හඳුන්වා දෙමින් පරිගණක අංශයක්ද එහි ආරම්භ විය. අධ්‍යාපන අමාත්‍යංශයෙන් පරිගණක යන්ත්‍ර තුනක් ලැබුණු අතර පසු කලෙක ලන්ඩනයේ වෙසෙන රාහුල ආදි ශිෂ්‍ය ඩී. ප්. නිහාල් එමානුවෙල් මහතාද පරිගණක යන්ත්‍රයක් එම අංශයට පරිත්‍යාග කෙළේය.

ප්‍රථම වරට විදේශ සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවෙන් යවන ලද පාසල් ක්‍රිකට් කණ්ඩායමට රාහුල විද්‍යාලයේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයකු වූ මහින්ද ඒකනායක ශිෂ්‍යයා තෝරා ගනු ලැබුවේ විජයවර්ධන විදුහල්පතිතුමන්ගේ යුගයේදීය. රාහුල ශිෂ්‍ය නායකයින්ගේ මෙහෙයවීමෙන් මාතර දිස්ත්‍රික්කයේ පාඨශාලාන්තර දැනුම මිනුම තරගාවලියක් පවත්වා ජයග්‍රාහකයින් තෝරා ත්‍යාග ප්‍රදානය සැළැසුම් කෙළේද විදුහල්පති විජයවර්ධන මහතාය.

පළමු වසරේ සිටම ඉංග්‍රීසි ඉගැන්වීම මෙම කාලයේ ආරම්භ වූ අතර ප්‍රාථමික අංශයට විද්‍යාව උගැන්වීමද ඇරැඹුනේ මේ යුගයේදීමය. ඒ සඳහා සුදුසු විද්‍යාගාරයක්ද සැළැසුම් කරනු ලැබීය. විද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේදී එක පන්තියක ශිෂ්‍ය උපරිමය 40 පමණක් වන පරිදි සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දුන් විදුහල්පති විජයවර්ධන මහතා ඒ ගැන දෙමාපියන් හා විද්‍යාලයේ සංවර්ධන සමිතිය හා ආදි ශිෂ්‍ය සමිතියද දැනුවත් කොට ඒ සඳහා ඔවුන්ගේ ආශිර්වාදයද ලබා ගත්තේය.

රාහුල ආදි ශිෂ්‍ය මව් සංගමය නිවැරදි තීරණ වලට යොමු කරමින් දියුණු කළ විදුහල්පති තුමා එයට අරමුදල් සම්පාදනය සඳහා නාට්‍ය දර්ශනයක් පවත්වා ප්‍රමාණවත් ආදායමක් ලබන්නටද මග පෙන්විය.



# මහින්ද ජාගොඩ මහතා

## 1986-1987

රාහුල විද්‍යාලයේ ඉදිරි ගමන තවදුරටත් ප්‍රවර්ධනය කරනු පිණිස අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ජාතික පාසල් අංශයේ හා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ වාර්තා මගින් පෙන්වා දෙන ලද කරුණු රැසක් විය. මෙම කරුණු එකින් එක තෝරා බේරා ගෙන කඩිනම් සංවර්ධනයක් විද්‍යාලයේ අභ්‍යන්තරික මෙන්ම භෞතික වශයෙන්ද ඇති කරන්නට සමත් වූ විදුහල්පතිතුමකු ලෙස මහින්ද ජාගොඩ මහතා හැඳින්විය හැකිය.

අධ්‍යාපන ක්ෂෙත්‍රයට පූර්ණ වශයෙන් අවතීර්ණ වෙමින් ගුරු සේවය ස්වකීය වෘත්තිය කර ගන්නට හේතුවන තරම් ජයග්‍රහණ ජාගොඩ මහතා පාසල් වියේදීම ලැබූ කෙනෙකි. ගාල්ලේ මාබොටුවන කණිෂ්ඨ විද්‍යාලයේ ඉගෙනීම ලබද්දී ලංකාවේ ප්‍රථම වරට පවත්වන ලද පහ වසර නිදහස් ශිෂ්‍යත්ව විභාගයේදී ලැබූ ජයග්‍රහණය ඉන් වැදගත් එකකි. එමගින් වඳුරඹ මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත්වීමේ භාග්‍යය ලැබීමෙන් පසු සාර්ථක ද්විතියික අධ්‍යාපනයක් ලබා මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණුවෙන් පසු පෙරලා වඳුරඹ මධ්‍ය මහා විද්‍යාලයට ගියේ ද්විතියික පුහුණු ගුරුවරයකු වශයෙනි.

පුහුණු ගුරුවරයකු ලෙස කටයුතු කරද්දීම ලන්ඩන් බී. ඒ. උපාධිය දිනාගත් පසු වඳුරඹ මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති ධුරයට එතුමා පත්විය. ඉන්පසු නැවතත් මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයට බැඳී එහි අධ්‍යාපන පරිපාලනය පිළිබඳ ලැබූ සාර්ථක පුහුණුවෙන් ඉක්බිතිව එතුමා රාහුල විද්‍යාලයේ විදුහල්පති ධුරයට තෝරා ගනු ලැබිණි.

වරින් වර යටපත් වී තිබූ සිසු කුසලතා ඉස්මතු කොට ගනිමින් සිසුන්ගේ දක්ෂකම් තුළින් රාහුලයට කීර්තියක් ලබාදීමට ජාගොඩ විදුහල්පතිතුමා යටතේ කිහිපවරක්ම අවස්ථා උදාවිය. උසස් තත්ත්වයේ තිබූ අ.පො.ස උසස් පෙළ විභාග ප්‍රතිඵල තවත් ඉහළ මට්ටමකට ගෙන යාමටත්, දීර්ඝ කාලයකට පසුව අ.පො.ස උසස් පෙළ විද්‍යා අංශයෙන් විශිෂ්ඨ සාමර්ථයන් හතරක්ම ලබා ගත් සිසුවකු හඳුන්වා දීමටත් හැකිවීම ඊට සාධක දෙකක් ලෙස සැළකිය හැකිය.

1986 පෙබරවාරියේ සිට එතුමා විදුහල්පති ධුරය දැරූයේ වසරක පමණ කෙටි කාලයක් වුවද විද්‍යාලයේ මනා දියුණු වක් පෙන්වීමට මහින්ද ජාගොඩ යුගයේ ගුරු-සිසු පිරිසට පිළිවන් විය. එය තරමක ශිෂ්‍ය අසහනයක් තිබූ යුගයක් වුවද, සියලු අභියෝගයන්ට මුහුණ දෙමින් විශේෂයෙන්ම ශිෂ්‍යයින්ගේ ආරක්ෂාව සහතික කරන්නට එතුමා ප්‍රධාන ගුරු මණ්ඩලය සමත්වූයේය. මේ සඳහා පාසල් සංවර්ධන සමිතියෙන් පූර්ණ සහයෝගය ලබා ගැනීම මහින්ද ජාගොඩ විදුහල්පතිතුමා ලත් ජයග්‍රහණයකි. විද්‍යාලය වටා ආරක්ෂක තාප්පය, ආරක්ෂක මුරගෙය, ගොඩනැගිලි අළුත්වැඩියාවන්, විදුලිබල පහසුකම්, ක්‍රීඩාංගනය ආදිය ගැන යෝජනා හා තීරණ සම්මත වූයේ මේ යුගයේය. විද්‍යාගාරය හා පුස්තකාලය දියුණු කිරීම සහ පිහිණුම්, ජිම්නාස්ටික් හා පාපන්දු ක්‍රීඩා යලිත් ආරම්භ කිරීමට පියවර ගැනීම ගැන එතුමාගේ යුගයේ සිටි සිසු දරුවෝ අදත් එතුමාට ශිර්ෂ ප්‍රණාමය කරති.

1987 පෙබරවාරියේදී රාහුලයෙන් සමුගත් ජාගොඩ මහතා දකුණු පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන පරිපාලන නිලධාරියකු ලෙසත්, ඉක්බිතිව දකුණු පළාත් පාසල් වල ඉගැන්වීම් අගැයීම් හා පර්යේෂණ අංශයේ පරිපාලකයකු ලෙසත්, ඊටත් පසුව දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යංශයේ සහකාර ලේකම් කෙනෙකු ලෙසත් කටයුතු කොට 1992 වසරේදී විශ්‍රාම ලැබීය.



# නන්ද වීරතුංග මහතා
## 1987-1989

රාහුල විද්‍යාලයේ අධ්‍යාපනය හා ක්‍රීඩා කටයුතු සෙසු විදුහල් සමග තරගකාරී මට්ටමකට පත්ව තිබුනද, පසුගිය වසර ගණනාවකම තිබූ ප්‍රධානම ගැටළුව නම් ස්ථිර ලෙස එක විදුහල්පතිවරයකුගේ මග පෙන්වීම විද්‍යාලයට හා ගුරු-සිසු දෙපිරිසට නොලැබීමයි. ඔවුන් කිහිප දෙනෙක්ම පැමිණියහ. ස්වල්ප කලක් සිටියහ. ඉක්බිතිව ආපසු ගියහ. මෙම යුගවල රාහුල විද්‍යාලයේ විදුහල්පති ධූරයට පැමිණි තවත් අයෙකි නන්ද වීරතුංග මහතා.

සෙසු විද්‍යාලයන්හි මෙන්ම රාහුල විද්‍යාලයෙහිද ආදි ශිෂ්‍ය සංගම්, සිය විදුහල් මාතාවට විද්වත් හා කාර්යශූර විදුහල්පතිවරයකු සොයමින් සිටි 1987 වර්ෂයේදී, සඳ ලංකාවේ විදුහල්පතිවරයකු වශයෙන් සේවය කරමින් සිටි නන්ද වීරතුංග මහතා අමාත්‍යංශයට කැඳවා විදුහල්පති ධූරයට පත් කරන ලදී. රටපුරා තිබූ ශිෂ්‍ය නොසන්සුන්තාව මාතර විද්‍යාලවලටද, රාහුල විද්‍යාලයටද අමුත්තක් නොවූ හෙයින් මෙතුමා විදුහල්පතිධූරය භාර ගැනිමෙන් පසු මුහුණ දීමට සිදුවූ ප්‍රබල අභියෝගයක් වූයේ එම නොසන්සුන් තාවයන් මග හරවා පැරණි රාහුලයට හුරුපුරුදු විනය හා ශික්ෂණ සංස්කෘතිය නැවත ප්‍රගුණ කිරීමය. මෙහිලා රාහුල ආදි ශිෂ්‍ය මාතර මව් සංගමයේද, කොළඹ ශාඛාවේද සහයෝගය නොඅඩුව තමාට ලැබුණු බැව් වීරතුංග මහතා සඳහන් කරනුයේ ප්‍රශංසා මුඛයෙනි.


*"ඉතාමත් පරිණත ආදි ශිෂ්‍යයින්ගේ මෙන්ම, නිතරම ඝෝෂාකාරී, එහෙත් ප්‍රයෝජනවත් තර්ක විතර්ක නිතර ගෙනහැර දක්වන නවරැල්ලේ තරුණ ආදි ශිෂ්‍යයන් සමගද සාමකාමීව කටයුතු කරමින් රාහුල විද්‍යාලයේ එදා පැවැති මුහුණුවර වෙනස් කොට නව මාවතකට යොමු කිරීමට හැකිවීම මට ලොකු සතුටක්"* යැයි එතුමා රාහුල වජ්‍ර ජයන්තිය ගැන උද්දාම වෙමින් සඳහන් කරයි.

රාහුල ආදි ශිෂ්‍ය සංගමය හා සංවර්ධන සමිතිය දැක්වූ උනන්දුව හා සහයෝගය මත විද්‍යාලයට ස්ථිර ශිෂ්‍ය වාර්තා පුස්තකයක්ද, විනය නීති මාලාවක්ද සකස් කර ගැනිමට විදුහල්පති නන්ද වීරතුංග මහතාට හැකිවිය. මේ නිසා විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණ කටයුතු ද නීතිමය තත්ත්වයකට ගෙන ඒමට එතුමාට ඉඩ සැළැසුනු අතර, විදුහලට සිසුන් ඇතුළු කිරීමේදී ආදි ශිෂ්‍යයින්ගේ දරුවන් වෙනුවෙන් ලකුණු ක්‍රමයක් සම්පාදනය කිරීමටද එතුමා පුරෝගාමී වූයේය.

විශේෂයෙන්ම 1987-89 ශිෂ්‍ය අරගල හා දකුණු පළාතේ තරුණ අසහනයද, භිෂණයද ඉස්මතු වූ අවස්ථාවේ රාහුල විද්‍යාලයේ සියලු සිසුන් ආරක්ෂා කර ගැනිමට දෙමාපිය න්ගේත් ආචාර්ය මණ්ඩලයේත් පූර්ණ සහාය ලබා පෙරමුණ ගත් වීරතුංග විදුහල්පතිතුමා විදුහලේ සිටි ලොකු කුඩා සැම සිසු දරුවකුගේම පූර්ණ ආරක්ෂාව සහතික කෙළේය.

මේ සියලුම අභියෝග මධ්‍යයේ රාහුල දරුවන්ගේ ගුණාත්මක වර්ධනයද අධ්‍යාපන කුසලතාද තහවුරු කරමින් තමන්ගේ කාලයේදී ඉතා උසස් අ.පො.ස සාමාන්‍ය පෙළ ප්‍රතිඵලද ලබාගන්නට එතුමා සමත්විය.

සුප්‍රසිද්ධ ගත් කතුවරයකු වන වීරතුංග මහතා විසින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් විවිධ ශාස්ත්‍රිය ග්‍රන්ථ සියයකට අධික සංඛ්‍යාවක් ලියා පළකොට තිබේ. සිංහල බසින් අරාබි භාෂාව උගැන්වීම සඳහාද මුලින්ම ග්‍රන්ථයක් සම්පාදනය කෙළේ එතුමාය. ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල හා අනුමත පිරිවෙන් වල අ.පො.ස සාමාන්‍ය පෙළ භූගෝල විද්‍යාව පන්ති පොතද, උසස් පෙළ භූගෝල විද්‍යාව අලලා ග්‍රන්ථ රැසක්ද වීරතුංග මහතාගේ කෘති අතර වෙයි.



# ආරියසිංහ එම්. ලියනගේ මහතා

## 1989-1990

ලෝකයේ බොහෝ විද්‍යා පීඨයන්හි සිසු අරගල ඉස්මතුව, විනය හික්මීම පිරිහී, අධ්‍යාපන යන්ත්‍රයද අකර්මණ්‍යව, යන අවස්ථා බොහෝය. රාහුල විද්‍යාලයේද වරින් වර එවැනි දෑ සිදුවිය.

ආරියසිංහ ලියනගේ මහතා විදුහල්පති පදවියට පත්වද්දී ද රාහුලයේ එවැනි නොසන්සුන් බවක් තරමක් දුරට තිබිණි. එහෙත් එතුමා සිසු-ගුරු සුහදතාවය ගොඩ නංවා පාසල් පරිසරය ප්‍රතිසංස්කරණය කළේය. සිය ගෙදර දොරට වඩා විද්‍යාලය කෙරෙහි ආදරයක් සිසු දරුවන් තුළ ජනිත කිරීමට පියවර ගත්තේය. ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයන් බිහි කරන්නට උරදී ක්‍රීඩා ගුරතාද දිනා රාහුලයේ නවෝදයක් ඇති කළේය.

ගාල්ලේ මහින්දයෙන් අධ්‍යාපනය ලබා, පේරාදෙණියෙන් උපාධිය දිනා විදුහල් රැසක විදුහල්පති පදවි දරා, අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලතල ද හොබවා එතුමා ලත් අත්දැකීම් මෙකී වික්‍රමයන්ට පාදක විය.


මහින්ද විද්‍යාලයේදී 1956 කලා අංශයෙන් හොඳම ශිෂ්‍යයාට ලැබෙන ආරියපාල රන් පදක්කම දිනාගන්නට හා විශ්ව විද්‍යාලයෙන් 1961 දී ලැබූ උපාධියෙන් පසු 1967 දී අධ්‍යාපන ඩිප්ලෝමාව දිනා ගන්නට ලියනගේ මහතා දැක්වූ ශූරතාවය රාහුලයේදීත් නොඅඩුව පැවැතිම මෙම ජයග්‍රහණයන්ට හේතු වන්නට ඇතැයි සිතිය හැක.

1967 සිට 1987 දක්වා වසර විස්සක්ම දක්ෂ විදුහල්පති වරයකු වශයෙන් දිවයිනේ විවිධ පළාත්වල සේවය කිරීමෙන් ලත් අත්දැකීම් සම්භාරයක්ද එතුමා සතු විය. ඉක්බිතිව 1988 දී අධ්‍යාපන පරිපාලන සේවයේ දෙවන පන්තියේ පත්වීමක් ලැබ අධ්‍යාපන නිලධාරියකු වශයෙන් සේවය කරන අතරතුර අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 1989 දී රාහුල විද්‍යාලයාධිපති ධුරයට ලියනගේ මහතා තෝරා ගනු ලැබිය.

ආරියසිංහ ලියනගේ විදුහල්පතිතුමා සෙසු විදුහල්පති වරුන්ට වඩා වෙනස් රීතියක පිහිටා කටයුතු කළ කෙනෙකි. එදා රාහුලය පැවැති තත්ත්වය අනුව එතුමාට එසේ කටයුතු කරනු හැරෙන්නට වෙනත් විකල්පයක් තිබුනේ නැත.

එතුමා වරෙක විදුහලේ පරිපාලනය විමධ්‍යගත කොට, කාර්යාලයීය කටයුතු සිය සහායකයිනට පවරා විශේෂයෙන්ම අධ්‍යාපනය පිළිබඳව අධීක්ෂණය කෙළේය. තවත් වරෙක පන්ති කාමරයට ගොස් සිසුන් සමග හිඳ ගුරුවරුන් අධ්‍යාපනය ලබා දෙන ප්‍රවීනතාවය හා ක්‍රමවේදයන් නිරීක්ෂණය කෙළේය. පසුව ගුරුවරුන් සමග සාකච්ඡා කොට ඔවුන්ගේ අඩුපාඩු සම්පූර්ණ කර දුන්නේය. තවද ඉංග්‍රීසි කථනය සිසුන් තුළ ප්‍රගුණ කරන්නට ඉංග්‍රීසි කථන සමාජයන් ආරම්භ කොට හැම සිසුවකු සමගම ඉංග්‍රීසි බසින් කතා කරන්නට උනන්දු වූයේය. සිසුන් සඳහා පොදු විවේකාගාරයක් සකස් කොට ඔවුන්ට විවේක ඇති වේලාවන්හි එහිදී ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ සිසුන්ට මුණ ගැසෙන්නට සළස්වා ඔවුන් අතර සහෝදරත්වයක් ගොඩ නංවාලිය.

ආදි ශිෂ්‍ය සමිති වලින් විද්‍යාලයට ලබා ගත හැකි සහයෝගය කෙරෙහි විශ්වාසය තැබූ ලියනගේ විදුහල්පතිතුමා විදුහලට සිසුන් ඇතුළත් කර ගැනිමේදී ආදි සිසුන්ට ඇතැම් වරප්‍රසාද හිමිවුවද ඒවා සිය අයිතිවාසිකම් ලෙස නොසැළකිම ගැන රාහුල ආදි සිසුන්ට පිරිනැමුයේ ස්තුතිපූර්වක ප්‍රශංසාවකි.



# එන්. ආරියවංශ මහතා
## 1990 - 1998

රාහුල විද්‍යාලයේ විද්‍යාලයාධිපති පදවියට පත්වූ තුන් වැනි රාහුල ආදි ශිෂ්‍යයා එන්. ආරියවංශ මහතාය. එතුමා එම පදවියට පත්ව රාහුල වජ්‍ර ජයන්ති සමය දක්වා සාර්ථකව සිය සේවය ඉටු කලේය.

1955 දී රාහුල විද්‍යාලයෙන් ද්විතියික අධ්‍යාපනය ලබා ගැනිමට එකතු වූ ආරියවංශයින් 1959 දක්වා එහි අධ්‍යාපනය හැදෑරිය. ශාස්ත්‍රවේදි උපාධිය සඳහා 1959 දී පේරාදෙණිය සරසවියට තෝරා ගනු ලැබීමෙන් පසු එහි රාමනාදන් ශාලා ශිෂ්‍ය සංගමයේ උප සභාපති හා සරසවියේ බාහිර සඟරා සංස්කාරක ලෙස ඔහු පුළුල් අත්දැකිම් රැසක්ම ලබා ගත්තේය. 1963 සරසවියෙන් පිටවත්ම උපගුරු තනතුරක් ලැබී තල්පාවිල හා ගොඩපිටිය මහා විද්‍යාලවල සේවය කිරීමෙන් අනතුරුව ආරියවංශයින්ට බෝපාගොඩ මහා විද්‍යාලයේ විදුහල්පති තනතුරක්ද ලැබී 1972 දක්වා එම සේවයෙහි නිරත විය.

එතැන් සිට දස වසරක් දෙනියාය ප්‍රදේශයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි වශයෙන්ද, තවත් සිව් වසරක් මොරවක කොට්ඨාශ අධ්‍යාපන නිලධාරි වශයෙන්ද, එයිනික්බිතිව අට වසරක් නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ වශයෙන්ද කළ සේවයෙන් පසු එතුමා රාහුල විද්‍යාලයේ විදුහල්පති පදවියෙන් පිදුම් ලැබුවේය.

අඩාල වී තිබූ විද්‍යාලයීය විවිධ සංගම් යලි පණ ගන්වමින් විද්‍යාලයේ අධ්‍යාපන පුනරුදය සඳහා බලවත් අඩුපාඩුවක්ව තිබූ ප්‍රධාන පුස්තකාලයට අමතරව විමර්ශන පුස්තකාලයක් ඇරඹුයේ එතුමාය. උසස් පෙළ සිසුන් සඳහා විශේෂ දේශන හඳුන්වා දීමටද, සිසුන්ගේ කුසලතා අගැයීමේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සව නැවත ආරම්භ කිරීමටද, වසර 12 ක් පමණ කළ එළි නොබැසි *"රාහුල"* සඟරාව යලි දොරට වැඩීමටද පියවර ගත්තේ ආරියවංශ විදුහල්පති තුමාය.


සිසු දරුවන් වෙනුවෙන් සමුපකාරයක් ආරම්භ කොට ගුරු සුභ සාධනය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකසා පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් විදුහල නව පරිමාණයනට යොමු කරන්නට පමණක් නොව, කාලයක් තිස්සේ වසා දමා තිබූ නේවාසිකාගාරය යලි විවෘත කරන්නටද එතුමා උත්සුක වූයේය.

පරිගනක තාක්ෂණය, විද්‍යාලයේ සහ සිසුන්ගේ ආරක්ෂාව, පරිසර අලංකාරය, රාහුල තූර්ය වාදක කණ්ඩායමට හැඳුනුම්පත් හා පළඳින පදක්කම් විදුහල්පති ආරියවංශ මහතාගේ මූලිකත්වයෙන් විද්‍යාලයට ලැබුණු සම්පත් ලෙස සැළකිය හැකිය.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තිමය තිරණය අනුව වෙලේගොඩ සුදර්ශන ආදර්ශ විද්‍යාලය රාහුල ප්‍රාථමික අංශය බවට පරිවර්තනය වීම නිසා ආරියවංශ මහතාට එල්ල වූ අභියෝග හා වගකිම් සම්භාරය ඉතා විශාලය. එහෙත් එතුමා එඩිතරව ඊට මුහුණ දෙමින් ස්ථාන දෙකෙහිම පරි පාලනය සාර්ථකව ඉටු කළ ආකාරය රාහුල ගුරු-සිසු හා ආදි සිසු හැමගේම ප්‍රශංසාවට හේතුවිය.

රාහුල මාතාව සිය වජ්‍ර ජයන්ති සමයේ විදුහල්පති එන්. ආරියවංශ මහතාට සිය අප්‍රමාණ වූ භක්ති ප්‍රණාමය හරසරින් පුද කරන්නිය.

# සරත් ගුණරත්න මහතා
## *1998*



රාහුල විද්‍යාලයේ 13 වන විදුහල්පති වශයෙන් 1998 දෙසැම්බර් 10 දින රාජකාරි භාරගත් සරත් ගුණරත්න මහතා විදුහල්පති ධුරය ලත් 04 වන ආදි ශිෂ්‍යයාය.

1950 වර්ෂයේ රාහුල විද්‍යාලයේ 4 වන පන්තියට නාකුළුගමුව ද්විභාෂා පාසැලෙන් ඇතුළත් වූ ඔහුගේ පන්ති භාර ගුරුතුමිය වූයේ ජැන්ස් මෙනෙවියයි. 1959 දී සරසවි පිවිසුම් පෙළ පන්තියේ සිටි ඔහුට එය සුවිශේෂ වසරක් වූයේ ඉතිහාසයේ පළමුවරට ශිෂ්‍යාවන් කිපදෙනෙකු සුදු සාරියෙන් සැරසී සරසවි පිවිසුම් පෙළට ඇතුළුවීමයි. 1961 දී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට ඇතුලත්ව 1964 දී උපාධිධාරි උප ගුරුවරයෙකු වශයෙන් ඔහු රජයේ සේවයට බැඳුනේය. අනතුරුව විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙන් 1971 දී අධ්‍යාපන ඩිප්ලෝමා පශ්චාත් උපාධිය ලබාගෙන, හම්බන්තොට බෝලාන විදුහලේ වැඩබලන විදුහල්පති වශයෙන් පත්විය. 1976 දී දෙවන ශ්‍රේණියේ විශේෂ තනතුරක් ලත් ගුණරත්න අම්බලන්තොට වෙරපුත්ත මහා විද්‍යාලයේ විදුහල්පති වශයෙන් පත් කරන ලදී. එතුමා 1982 වර්ෂයේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට උසස්වීම් ලැබ 1998 දෙසැම්බර් 09 වන දින දක්වා පුරා වසර 21 ක් වෙරපුත්ත විදුහල්පති වශයෙන් සේවය කෙළේය.

ආරියවංශ මහතාගෙන් ප්‍රජාචාරයත්, වික්‍රමරත්න මහතාගෙන් භූගෝල විද්‍යාවත්, ජස්ටින් විජේවර්ධන මහතාගෙන් බුද්ධාගමත්, ඩී. ජ. විජේවර්ධන මහතාගෙන් සිංහලත් උගත් බව හේ සතුටින් සඳහන් කරයි. ඔහු රාහුලයේ ශ්‍රේෂ්ඨතම විදුහල්පතිතුමන් වූ කුමාරගේ මැතිඳුන්ගෙන් ද 09 වන පන්තියේ දී භූගෝල විද්‍යාව හදරා ඇත.

5014ක් වූ ශිෂ්‍ය පිරිසක් සහ 167ක් වූ ගුරු මණ්ඩලයකින් පිරිපුන් රාහුලය සිය වජ්‍ර ජයන්තිය සමරන කාල පරිච්ඡේදයේ විදුහල මෙහෙයවන්නට සරත් ගුණරත්නයන්ට ආදි ශිෂ්‍යයෙකු වශයෙන් වරම් ලැබීම ඉමහත් භාග්‍යයක් ලෙස ඔහු විසින් සලකන බව නොඅනුමානයි.